**ශ්‍රී ලංකා මහ බැංකුව**
**බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව**

**2020 ජනවාරි 30** **චක්‍රලේඛය** **2020 අංක 02**

## ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා ණය සහන ලබාදීම

රටෙහි ආර්ථික වර්ධනය වේගවත් කිරීමේ අරමුණින් සහ ගරු අග්‍රාමාත්‍යතුමා සහ මුදල් ඇමතිතුමා, ජනාධිපති කාර්යාලයේ නිලධාරීන්, අග්‍රාමාත්‍ය කාර්යාලය සහ මුදල් අමාත්‍යාංශය සමඟ පැවති සාකච්ඡා පදනම් කරගනිමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල (මින් ඉදිරියට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වේ) සුදුසුකම්ලත් සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය ගැණුම්කරුවන් සඳහා 2020.01.01 සිට 2020.12.31 දක්වා කාලය සඳහා රජය විසින් දැනටමත් නිවේදනය කර ඇති සහන සහ දිරිගැන්වීම් වලට අනුපූරක ලෙස, විශේෂ ණය සහන යෝජනාක්‍රමයක් ලබාදීමට බලපත්‍රලාභී බැංකු එකඟවී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු සමඟ පැවති සාකච්ඡා වලට අනුව මෙම යෝජිත ණය සහන යෝජනාක්‍රමය හේතුවෙන් බැංකු පද්ධතියෙහි ස්ථායීතාවයට අහිසි පීඩනයක් හෝ තර්ජනයක් ඇති නොවනු ඇතැයි නිරීක්ෂණය කර ඇත. ඒ අනුව, මෙම යෝජනාක්‍රමය බලපත්‍රලාභී බැංකු අතර ඒකාකාරී ලෙස ක්‍රියාවට නැංවීම සඳහා මාර්ගෝපදේශයන් මෙම චක්‍රලේඛය මගින් නිකුත් කරනු ලැබේ.

1. **පොදු කොන්දේසි සහ නියමයන්**

   (i) **සුදුසුකම්ලත් සහභාගීවන්නන්:** බලපත්‍රලාභී බැංකු වලින් ණය පහසුකම් ලබා තිබෙන, පහත (ii) ඡේදයෙහි සඳහන් කර ඇති ව්‍යාපාර අංශ වල නිරත වන, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් මේ සඳහා සුදුසුකම් ලබයි. මෙම යෝජනාක්‍රමයෙහි කරුණු සඳහා, 2019.12.31 දිනෙන් අවසන් වසර සඳහා රුපියල් මිලියන 16 සිට 750 දක්වා වාර්ෂික පිරිවැටුමක් සහිත ණය ගැණුම්කරුවන් සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ලෙස සැලකේ. එසේ වුවද, වාර්ෂික පිරිවැටුම සම්බන්ධයෙන් දක්වා ඇති පහළ සීමාව, එනම් රුපියල් මිලියන 16ක සීමාව, 2019.12.31 දිනට අක්‍රීය ණය කාණ්ඩයෙහි සිටින සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා අදාළ නොවේ.

   (ii) නිෂ්පාදන, සේවා, කෘෂිකර්ම (සැකසුම් ව්‍යාපාරද ඇතුලත්ව) සහ ඉදිකිරීම් අංශ මෙම යෝජනාක්‍රමය මගින් සහන සැලසෙන ව්‍යාපාරික අංශ වේ. සැකයකට තුඩු නොදීම සඳහා, යන්ත්‍ර සහ උපකරණ ආනයනය හැර අනෙකුත් ආනයන සඳහා ලබාදී ඇති ආනයන ණය පහසුකම් මෙම යෝජනාක්‍රමයට ඇතුලත් නොවේ. වාහන ආනයනය සඳහා ලබාදුන් ණය පහසුකම් සඳහාද මෙමගින් අවසර ලබාදී නොමැත. එසේ වුවද, 2019.12.31 දිනට අක්‍රීය ණය කාණ්ඩයෙහි සිටින සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් යෝජනාක්‍රමයට සම්බන්ධ කර ගැනීමේදී පමණක්, යෝජනාක්‍රමය යටතට ගැනෙන

ව්‍යාපාර අංශ වලට අගය එකතු කල ව්‍යාපාර සහ වෙළඳාම්ද ඇතුලත් වේ.

(iii) පහත දක්වා ඇති අවශ්‍යතාවයන්ට යටත්ව, ශ්‍රී ලංකා රුපියල් වලින් ලබාදී ඇති, ව්‍යාපාර ආශ්‍රිත කාලීන ණය, කල්බදු පහසුකම්, අයිරා ණය පහසුකම් සහ වෙළඳ ණය පහසුකම් මෙම යෝජනාක්‍රමය යටතේ සහන ලබාදෙන ණය පහසුකම් වේ.

(iv) ණය ගැණුම්කරුවන් විසින් ලිඛිත ඉල්ලීමක් 2020.02.10 දින හෝ ඊට ප්‍රථම ඉදිරිපත් කර ඇති අවස්ථාවන්හිදී, බලපත්‍රලාභී බැංකු විසින් සියළුම සුදුසුකම්ලත් ණය ගැණුම්කරුවන්ට මෙම ණය සහන යෝජනාක්‍රමය යෝජනා කළ යුතු අතර, 2020.03.31 දින වනවිට යෝජනාක්‍රමය ක්‍රියාත්මක මට්ටමට ගෙන ආ යුතුය.

(v) ණය සහන යෝජනාක්‍රමයෙහි කාලය තුළ, යෝජනාක්‍රමයට සැලකිල්ලට ගනු ලබන ණය පහසුකම් සඳහා ගෙවිය යුතු ණය පොලිය ණය ගැණුම්කරුවන් විසින්, මෙම යෝජනාක්‍රමයට අදාළ වන කොන්දේසි වලට අනුකූලව අඛණ්ඩව ගෙවිය යුතුය.

(vi) ඉහත (v) ඡේදයෙහි සඳහන් පරිදි ණය පොලිය ආපසු ගෙවීමට අපොහොසත් වන ණය ගැණුම්කරුවන්හට තවදුරටත් මෙම යෝජනාක්‍රමයෙහි ප්‍රතිලාභ භුක්ති විඳීමට නොහැකි වන අතර, ඔවුන් මෙම යෝජනාක්‍රමයට සහභාගිවන්නන් ලෙසද නොසැලකේ. ඒ අනුව, බලපත්‍රලාභී බැංකුවලට සුදුසු අවදානම් අවම කරගැනීමේ ක්‍රියාපටිපාටීන් අනුගමනය කල හැක.

(vii) මෙම යෝජනාක්‍රමයෙහි මෙහෙයුම් තොරතුරු මෙම චක්‍රලේඛයෙහි 2 සිට 6 අංශ වල දක්වා ඇත.

2. **සක්‍රීය ණය**

(i) කිසියම් බලපත්‍රලාභී බැංකුවකින් 2019.12.31 දින වනවිට, රුපියල් මිලියන 300ක සීමාව දක්වා අරමුදල් පාදක කරගත් මුළු ණය සහ අත්තිකාරම් ප්‍රමාණයක් ලබාගෙන ඇති, සුදුසුකම්ලත් ණය ගැණුම්කරුවන් අදාල බැංකුවෙන් මෙම යෝජනාක්‍රමය යටතේ ලබා දෙන ප්‍රතිලාභ ලබාගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ii) 2020.02.10 දින හෝ ඊට ප්‍රථම ණය ගැණුම්කරුවන් විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති විට, බලපත්‍රලාභී බැංකු විසින් සියලු සුදුසුකම් ලත් කාලීන රුපියල් ණය සඳහා, 2020.01.01 - 2020.12.31 කාලය සඳහා ප්‍රාග්ධන සහන කාලයක් යෝජනා කළ යුතුය.

(iii) ප්‍රාග්ධන සහන කාලය සඳහා සුදුසුකම්ලත් ණයවල කාලය, ඒවායෙහි ණය වාරිකයෙහි වටිනාකම වෙනස් නොවන අයුරින්, බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රාග්ධන සහන කාලයෙහි ප්‍රමාණයෙන් දීර්ඝ කරනු ඇත.

(iv) ණය කල්දමන කාල සීමාව තුළදී, ණය පොලිය, දඩ පොලී කොටසක් නොමැතිව,

ගිවිසුම්ගත පරිදි අයකළ යුතුය.

(v) 2020.03.31 දක්වා කාලය තුළ ගෙවා දැමීමට නියමිත හෝ කල්පිරීම සිදුවන හෝ නැවත සමාලෝචනය සඳහා සලකා බැලෙන, ස්ථාවර අයිරා ණය පහසුකම් 2020.06.30 දක්වා දීර්ඝ කරනු ලැබේ. එසේ වුවද, 2019.12.31 දිනට පැවති තාවකාලික අයිරා ණය පහසුකම් සම්බන්ධයෙන්, එම තාවකාලික අයිරා ණය සීමාවන් කල්පිරීම මාස 2කින් දිගුකෙරේ.

(vi) 2020.03.31 දක්වා කාලය තුළ ගෙවා දැමීමට නියමිත හෝ කල්පිරීම සිදුවන හෝ නැවත සමාලෝචනය සඳහා සලකා බැලෙන, සුදුසුකම්ලත් වෙළඳ ණය පහසුකම් දින 30කින් දීර්ඝ කරනු ලැබේ.

(vii) ණය ගැණුම්කරුවන් විසින් විශ්වසනීය ව්‍යාපාර සැලසුමක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවන්හිදී, බලපත්‍රලාභී බැංකු විසින්, එක් ණය ගැණුම්කරුවෙකුට, එක් බැංකුවකට රුපියල් මිලියන 300ක උපරිමයකට යටත්ව සහ පහත සඳහන් කොන්දේසි වලට අනුකූලව, ආයෝජන හෝ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා අතිරේක ණයක් හෝ නව ණය පහසුකමක් හෝ ප්‍රදානය කළ හැක:

(අ) ව්‍යාපාර කටයුතු ප්‍රසාරණය කිරීම සඳහා ලබාදෙන, ආයෝජන අවශ්‍යතා ණය මුදල, බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතය + 1.5%ට සමාන පොලී අනුපාතයක් යටතේ වසර 05ක් තුළ ආපසු ගෙවා දැමිය යුතුය.

(ආ) කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා පිරිනමන ණය මුදල, බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතයට සමාන පොලී අනුපාතයක් යටතේ වසර 02ක් තුළ ආපසු ගෙවා දැමිය යුතුය.

(ඇ) වසරක උපරිම පමා සහන කාලයක් මෙවැනි ණය සඳහා ලබා දීමට බැංකු වලට සලකා බැලිය හැක.

(ඈ) මෙම යෝජනාක්‍රමය යටතේ ලබාදෙන අතිරේක ණය පහසුකම් වලින් පැනනැගිය හැකි අවදානම් අවම කිරීම සඳහා සුදුසු සුරැකුම් ලබාගැනීමට බලපත්‍රලාභී බැංකුවලට හැකියාව ඇත.

(viii) 2020.12.31 දින වනවිට කල්පිරෙන වෙනත් සහන යෝජනාක්‍රම යටතේ ලබාදී ඇති සහන ඇත්නම්, එවැනි සහන 2020.12.31 දක්වා දීර්ඝ කරනු ලැබේ. එසේ වුවද එවැනි ණය ගැණුම්කරුවන් මෙම යෝජනාක්‍රමය යටතේ පනවා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කල යුතුය.

(ix) ලබාගෙන ඇති මුළු ණය පහසුකම්වල වටිනාකම රුපියල් මිලියන 300 ඉක්මවන ණය ගැණුම්කරුවන් මෙම යෝජනාක්‍රමයට ඇතුලත් කර ගැනීම සම්බන්ධයෙන්,

එවැනි ණය ගැණුම්කරුවන් විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අවස්ථාවන්හිදී බලපත්‍රලාභී බැංකු විසින් අවස්ථානුකූලව තීරණය කරනු ඇත.

3. **අක්‍රීය ණය**

(i) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ බැංකු විසින් ණය නැවත අය කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති සහ නිවේදන නිකුත් කර ඇති ණයද ඇතුලත්ව, 2019.12.31 දින වන විට අක්‍රීය ණය කාණ්ඩයෙහි සිටින සුදුසුකම් ලත් සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන්, 2020.02.10 දින හෝ ඊට ප්‍රථම ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම මගින් පහත දක්වා ඇති සහන ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ii) ඉහත සඳහන් කර ඇති අක්‍රීය ණය සහ අත්තිකාරම් සම්බන්ධයෙන් එකතු වී, ආපසු නොගෙවා ඇති ණය පොලියෙහි අඩංගු දඩ පොලී ප්‍රමාණය, බලපත්‍රලාභී බැංකු විසින් කපා හරිනු ඇත.

(iii) ණය අත්තිකාරම් ප්‍රතිලේඛණගත කිරීමේ යෝජනා පහත පරිදි වේ:

(අ) ණය ගැනුම්කරු විසින් මූලික ප්‍රාග්ධන ප්‍රමාණයෙන් 50%ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ගෙවා ඇති ණය සඳහා, බලපත්‍රලාභී බැංකු විසින් මෙම යෝජනා ක්‍රමය සඳහා සලකා බලනු ලබන දිනය වන විට ගෙවීම පැහැර හැර ඇති වාරික වල එකතු වී ඇති, නොගෙවූ පොලියෙන් (ඉහත සඳහන් කර ඇති දඩ පොලී කපා හැරීමෙන් පසු) 50%ක් ආපසු ගෙවීම කල් දැමිය යුතුය. හිඟ ප්‍රාග්ධනය, ගෙවීම පැහැර හැර ඇති වාරිකවලට අදාළ නොගෙවූ පොලී ශේෂය සහ අනාගතයෙහි ගෙවිය යුතු පොලිය ප්‍රතිලේඛණගත කල යුතුය. ණය ගැනුම්කරු විසින් පහත (ඇ) සහ (ඈ) ඡේද ප්‍රකාරව ප්‍රතිලේඛණගත කල ණය ගෙවා අවසන් කල පසු, කල් දැමූ පොලිය කපාහැරීමට බලපත්‍රලාභී බැංකුව විසින් කටයුතු කල යුතුය.

(ආ) ණය ගැනුම්කරු විසින් මූලික ප්‍රාග්ධන ප්‍රමාණයෙන් 50%කට අඩු ප්‍රමාණයක් ගෙවා ඇති ණය සඳහා, බලපත්‍රලාභී බැංකු විසින් මෙම යෝජනා ක්‍රමය සඳහා සලකා බලනු ලබන දිනය වන විට ගෙවීම පැහැර හැර ඇති වාරික වල එකතු වී ඇති, නොගෙවූ පොලියෙන් (ඉහත සඳහන් කර ඇති දඩ පොලී කපා හැරීමෙන් පසු) 25%ක් ආපසු ගෙවීම කල් දැමිය යුතුය. හිඟ ප්‍රාග්ධනය, ගෙවීම පැහැර හැර ඇති වාරිකවලට අදාළ නොගෙවූ පොලී ශේෂය සහ අනාගතයෙහි ගෙවිය යුතු පොලිය ප්‍රතිලේඛණගත කල යුතුය. ණය ගැනුම්කරු විසින් පහත (ඇ) සහ (ඈ) ඡේද ප්‍රකාරව ප්‍රතිලේඛණගත කල ණය ගෙවා අවසන් කල පසු කල් දැමූ පොලී

කපාහැරීමට බලපත්‍රලාභී බැංකුව විසින් කටයුතු කල යුතුය.

(ඇ) ඉහත (අ) හා (ආ) ඡේදවල සඳහන් කර ඇති හිඟ ප්‍රාග්ධන ශේෂය ප්‍රතිලේඛණගතකර, මූලික ණය මුදලේ ගෙවීමට ඉතිරිවී ඇති වාරික ප්‍රමාණයට දෙගුණයකට නොවැඩි කාල සීමාවක් තුල ගෙවා අවසන් කල යුතුය. මේ සඳහා උදහරණයක් ඇමුණුම 1හි දක්වා ඇත.

(ඈ) ඉහත (අ) හා (ආ) ඡේදවල සඳහන් කර ඇති, ගෙවීම පැහැර හැරඇති වාරිකවලට අදාළ නොගෙවූ පොලී ශේෂය සහ අනාගතයෙහි ගෙවිය යුතු පොලිය ප්‍රතිලේඛණගතකර, මූලික ණය මුදලේ ගෙවීමට ඉතිරිවී ඇති වාරික ප්‍රමාණයට දෙගුණයකට නොවැඩි කාල සීමාවක් තුල ගෙවා අවසන් කල යුතුය. මේ සඳහා උදහරණයක් ඇමුණුම 1හි දක්වා ඇත.

(ඉ) ඉහත (ඇ) ඡේදයෙහි සඳහන් කර ඇති, ණය මුදල්වල ප්‍රාග්ධන කොටස පියවීම සඳහා වසරක සහන කාලයක් ලබාදිය යුතුය. නමුත්, ණය ගැනුම්කරු විසින් ඉහත (ඈ) ඡේදයෙහි සඳහන් කර ඇති පොලිය නිසි කලට ගෙවිය යුතුය.

(iv) බලපත්‍රලාභී බැංකු විසින් පහත ඡේද (ඈ)ට යටත්ව, අක්‍රීය ණය කාණ්ඩයේ සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්හට ව්‍යාපාර යළි පණ ගැන්වීම සඳහා නව කාරක ප්‍රාග්ධන ණය (හෝ තාවකාලික, කෙමෙන් හීන වන අයිරා පහසුකම්) ලබා දිය යුතුය:

(අ) ව්‍යාපාරයෙහි මාස තුනක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය උපරිම ණය සීමාව වන අතර, එවැනි ණයවල උපරිම කාල සීමාව මාස හයකි.

(ආ) මෙම ණය හෝ අයිරා වල ප්‍රාග්ධන කොටස ගෙවීම සඳහා මාස තුනක සහන කාලයක් හිමිවන අතර, පොලිය ණය ගැනුම්කරු විසින් නිසි කලට ගෙවිය යුතුය.

(ඇ) මෙම ණය පහසුකම් සඳහා පොළී අනුපාතය පවතින නිත්‍ය ණය පහසුකම් අනුපාතය + 2% නොඉක්මවිය යුතුය.

(ඈ) මෙම නව කාරක ප්‍රාග්ධන ණය පහසුකම්, පහත ඡේද 5 හි සඳහන් පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පරිපාලනය කරනු ලබන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයට ඇතුලත් වේ.

(v) බලපත්‍රලාභී බැංකු විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ, මෙම යෝජනා ක්‍රමයට සම්බන්ධ වන ණය ගැනුම්කරුවන්ගේ ණය සහ අත්තිකාරම් අයකර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මත කරගැනීම 2020.12.31 දක්වා කල් දැමිය යුතුය. ඉහත

යෝජනා ක්‍රමයට සහභාගීවන හා ඒ සඳහා අවශ්‍යතා සපුරා ඇති ණය ගැනුම්කරුවන් සම්බන්ධයෙන් මේ වන විටත් ණය අයකර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මත කර ඇති නම්, දේපල වෙන්දේසි කිරීම් 2020.12.31 දක්වා කල් දැමිය යුතුය. මෙම යෝජනාක්‍රමය යටතේ පනවා ඇති අවශ්‍යතා සැපිරීමට අපොහොසත්වන ණය ගැණුම්කරුවන් තවදුරටත් යෝජනාක්‍රමයෙහි සාමාජිකයින් ලෙස නොසැලකේ.

(vi) ණය අයකර ගැනීම සම්බන්ධයෙන් මේ වන විටත් අධිකරණ ක්‍රියාමාර්ග ගනිමින් පවතින ගනුදෙනුකරුවන් හට මෙම යෝජනා ක්‍රමයේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් අධිකරණයේදී ගිවිසුමකට එළඹීමෙන් අනතුරුව, මෙම යෝජනාක්‍රමයට සහභාගීවීමට අවසර ඇත.

(vii) මෙම යෝජනා ක්‍රමය යටතේ පිළිගෙන ඇති, අක්‍රීය ණය කාණ්ඩයේ සිටින ණය ගැනුම්කරුවන් සම්බන්ධයෙන්, බලපත්‍රලාභී බැංකු විසින් නෛතික ක්‍රියාමාර්ග ගැනීම අත්හිටුවිය යුතුය.

4. **බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රතිමූල්‍යයන යෝජනා ක්‍රමයන්හි ප්‍රාග්ධනය ආපසු ගෙවීම**

(i) බලපත්‍රලාභී බැංකු වෙත ලබා දී ඇති ප්‍රතිමූල්‍යන යෝජනාක්‍රමයන්හි 2020.01.01 සිට 2020.12.31 දක්වා සිදුකිරීමට පවතින ගෙවීම් හි ප්‍රාග්ධන ආපසු ගෙවීම් කල් දැමීමටත් අවසාන ගෙවීම් දිනය මාස 12කින් දීර්ඝ කිරීමටත් රජය විසින් කැමැත්ත පල කර ඇත. කෙසේ වෙතත්, එවැනි දීර්ඝකිරීම් අවශ්‍ය බැංකු මේ සම්බන්ධයෙන්, අදාළ රජයේ ආයතනයන්ගෙන් කාල දිගුවක් ඉල්ලා සිටිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් පරිපූරක ගිවිසුමකට එළඹිය යුතුය.

5. **ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය**

(i) මෙම චක්‍රලේඛයේ ඡේද 3(iv) යටතේ බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රදානය කරන අමතර ණය හා අත්තිකාරම් ලබා දීම නිසා ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීම සඳහා ප්‍රාග්ධන මුදලෙන් 75%ක් දක්වා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් රජය හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළියෙල කරනු ඇත.

(ii) බලපත්‍රලාභී බැංකු විසින් ඇප ක්‍රමය ලබා ගැනීමට බලාපොරොත්තු වේ නම් ඒ සඳහා වාර්ෂිකව 1%ක ඇපකර ගාස්තුවක් බැංකුව විසින් දැරිය යුතුය.

6. **ණය තොරතුරු කාර්යංශයට වාර්තා කිරීම්**

(i) බලපත්‍රලාභී බැංකු විසින් හුදෙක්ම අසතුටුදායක ණය තොරතුරු කාර්යංශ වාර්තා

පමණක් සැලකිල්ලට ගෙන ණය ලබාදීම් ප්‍රතික්ෂේප කිරීම වැලැක්වීම සඳහා සුදුසු ක්‍රමවේදයක් පවත්වාගත යුතුය.

(ii) බලපත්‍රලාභී බැංකු විසින් ණය තොරතුරු කාර්යංශය වෙතින් අදහස් විමසීමෙන් පසුව, මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රාග්ධන ගෙවීම් සිදු කිරීම් කල් දැමීම සම්බන්ධව වාර්තා කිරීමට සුදුසු ක්‍රමයක් සකස්කර ගත යුතු අතර, එමගින් මෙම යෝජනා ක්‍රමයට සහභාගී වන සක්‍රීය ණය ගැනුම් කරුවන්ට ඉදිරියේ කාලයේදී ඔවුන්ගේ ණය ශ්‍රේණිය හෝ ණය තොරතුරු කාර්යංශ වාර්ථාවන් මත මෙම යෝජනා ක්‍රමයට සම්බන්ධ වීම අයහපත් ලෙස බලපෑමක් සිදු නොවිය යුතුය.

7. **වාර්තාකරණ අවශ්‍යතාවය**

2020.02.01 දින සිට ක්‍රියාත්මකවන පරිදි, සෑම මසකම 15 සහ 30 දිනවලට පවතින ණය ගැණුම්කරුවන් වෙත ලබාදී ඇති ණය සහන සම්බන්ධයෙන් තොරතුරු, එම දින වල සිට, වැඩකරන දින 05ක් ඇතුලත, බලපත්‍රලාභී බැංකු විසින් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත වාර්තාකල යුතුය.

8. **පසුගිය චක්‍රලේඛය අවලංගු කිරීම**

ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා ණය සහන ලබාදීම සම්බන්ධයෙන් නිකුත් කල 2020 අංක 01 දරන චක්‍රලේඛය මෙමගින් අවලංගු කෙරේ.

අත්සන් කළේ
වී ඒ ඒ එන් ද සිල්වා මිය
**බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ**

## ණය ගැණුම්කරු විසින් ණයෙහි ප්‍රාග්ධනයෙන් 50% කට වඩා අඩුවෙන් ආපසු ගෙවා ඇති විට

| | |
|---|---|
| ණය ප්‍රමාණය | |
| ප්‍රදානය කළ ණය ප්‍රමාණය | රු. 1,000,000.00 |
| පොලී අනුපාතය | 8.00% |
| කාලය | මාස 60 |
| ප්‍රථමයෙන් එකඟවූ මාසික වාරිකය | රු. 23,333.33 - රු. 16,777.78 |
| ණය ප්‍රදානය කරන ලද දිනය | 2018.02.01 |
| ණය කල්පිරෙන දිනය | 2023.02.01 |
| ණය ආපසු ගෙවිය යුතු මුළු කාලය | මාස 60 |
| අවසන් ණය වාරිකය ගෙවා ඇත්තේ | 2019.04.01 |
| 2019.04.01 දිනට ගෙවා ඇති වාරික ගණන | 14 |
| 2019 මැයි සිට 2019 දෙසැම්බර් දක්වා හිඟ සිටි වාරික ගණන | 8 |
| 2019.12.31 සිට කල්පිරෙන දින දක්වා ඉතිරි වාරික ගණන | 38 |
| 2019.04.01 දිනට ගෙවිය යුතු ප්‍රාග්ධනය (අවසන් වාරිකය ගෙවූ දින සිට) | රු. 766,666.67 |
| 2019.04.02 සිට 2019.12.31 දක්වා නොගෙවූ සමුච්චිත පොලිය | රු. 37,777.78 |
| 2020.01.01 සිට කල්පිරෙන දිනය (2023.02.01) දක්වා ගෙවිය යුතු අනාගත පොලිය | රු. 82,333.33 |
| සහන යෝජනාක්‍රමය යටතේ ලබාදීමට යෝජිත සහන කාලය (මාස) | 12 |

### ණය වාරිකය ගණනය කිරීම

| | |
|---|---|
| ගෙවිය යුතු ප්‍රාග්ධනය | රු. 766,666.67 |
| ගෙවා ඇති ප්‍රාග්ධනය ණය මුදලෙන් 50%කට වඩා වැඩි නිසා සමුච්චිත පොලියෙන් 25%ක් සඳහා සහන ලබා ගැනීමට සුදුසුකම් ලබයි. ඉතිරි 75% නැවත අයකරගත යුතුය. (37,777.78*75%) | රු. 28,333.34 |
| අනාගත පොලිය 2020.01.01 සිට කල්පිරෙන දින (2023.02.01)දක්වා | රු. 82,333.33 |
| | **රු. 877,333.33** |

### පොලිය ආපසු ගෙවීම

| | |
|---|---|
| නැවත අයකර ගතයුතු මුළු පොලිය (28,333.33+82,333.33) | රු. 110,666.67 |
| ණය සහන හේතුවෙන් ණය ආපසු ගෙවීම දීර්ඝ කල හැකි උපරිම ආපසු ගෙවීමේ කාලය (38+8)*2 | මාස 92 |
| අනාගතයේ ගෙවිය යුතු මාසික පොලිය (28,333.33+82,333.33)/92 | රු. 1,202.90 මාස 92ක් තුල |

### ප්‍රාග්ධනය ආපසු ගෙවීම

| | |
|---|---|
| ණය සහන කාලයට පසු ගෙවිය යුතු ප්‍රාග්ධන ගෙවීම (766,666.67/80) | රු. 9,583.33 මාස 80 තුල (92-12) |
| ණය සහන කාලය තුල ගෙවිය යුතු මාසික ගෙවීම | රු 1,202.90 |
| ණය සහන කාලයෙන් පසුව මාසික ගෙවීම (1,202.90+9,583.33) | රු. 10,786.23 |

* පොලී අනුපාතය බල නොපායි.

* ණය ආපසු ගෙවන කාල සීමාව, සුදුසුකම් ලත් උපරිම ආපසු ගෙවීමේ කාලයට යටත්ව, අදාල බැංකු ශාඛාවට තීරණය කල හැක.

## ණය ගැණුම්කරු විසින් ණයෙහි ප්‍රාග්ධනයෙන් 50% කට වඩා වැඩියෙන් ආපසු ගෙවා ඇති විට

| | |
|---|---|
| ණය ප්‍රමාණය | |
| ප්‍රදානය කළ ණය ප්‍රමාණය | රු. 1,000,000.00 |
| පොලී අනුපාතය | 8.00% |
| කාලය | මාස 60 |
| ප්‍රථමයෙන් එකඟවූ මාසික වාරිකය | රු. 23,333.33 - රු. 16,777.78 |
| ණය ප්‍රදානය කරන ලද දිනය | 2016.02.01 |
| ණය කල්පිරෙන දිනය | 2021.02.01 |
| ණය ආපසු ගෙවිය යුතු මුළු කාලය | මාස 60 |
| අවසන් ණය වාරිකය ගෙවා ඇත්තේ | 2018.09.01 |
| 2018.09.01 දිනට ගෙවා ඇති වාරික ගණන | 31 |
| 2018 ඔක්තෝබර් සිට 2019 දෙසැම්බර් දක්වා හිඟ සිටි වාරික ගණන | 15 |
| 2019.12.31 සිට කල්පිරෙන දින දක්වා ඉතිරි වාරික ගණන | 14 |
| 2018.09.01 දිනට ගෙවිය යුතු ප්‍රාග්ධනය (අවසන් වාරිකය ගෙවූ දින සිට) | රු. 483,333.33 |
| 2018.09.02 සිට 2019.12.31 දක්වා නොගෙවූ සමුච්චිත පොලිය | රු. 36,666.67 |
| 2020.01.01 සිට කල්පිරෙන දිනය (2021.02.01) දක්වා ගෙවිය යුතු අනාගත පොලිය | රු. 11,666.67 |
| සහන යෝජනාක්‍රමය යටතේ ලබාදීමට යෝජිත සහන කාලය (මාස) | 12 |

### ණය වාරිකය ගණනය කිරීම

| | |
|---|---|
| ගෙවිය යුතු ප්‍රාග්ධනය | රු. 483,333.33 |
| ගෙවා ඇති ප්‍රාග්ධනය ණය මුදලෙන් 50%කට වඩා වැඩි නිසා සමුච්චිත පොලියෙන් 50%ක් සඳහා සහන ලබා ගැනීමට සුදුසුකම් ලබයි. ඉතිරි 50% නැවත අයකරගත යුතුය. (36,666.67*50%) | රු. 18,333.34 |
| අනාගත පොලිය 2020.01.01 සිට කල්පිරෙන දින (2021.02.01)දක්වා | රු. 11,666.67 |
| | **රු. 513,333.34** |

### පොලිය ආපසු ගෙවීම

| | |
|---|---|
| නැවත අයකර ගතයුතු මුළු පොලිය (18,333.34+11,666.67) | රු. 30,000.01 |
| ණය සහන හේතුවෙන් ණය ආපසු ගෙවීම දීර්ඝ කල හැකි උපරිම ආපසු ගෙවීමේ කාලය (15+14)*2 | මාස 58 |
| අනාගතයේ ගෙවිය යුතු මාසික පොලිය (18,333.34+11,666.67)/58 | රු. 517.24 මාස 58ක් තුල |

### ප්‍රාග්ධනය ආපසු ගෙවීම

| | |
|---|---|
| ණය සහන කාලයට පසු ගෙවිය යුතු ප්‍රාග්ධන ගෙවීම (483,333.33/46) | රු. 10,507.25 මාස 46 තුල (58-12) |
| ණය සහන කාලය තුල ගෙවිය යුතු මාසික ගෙවීම | රු 517.24 |
| ණය සහන කාලයෙන් පසුව මාසික ගෙවීම (517.24+10,507.25) | රු. 11,024.49 |

* පොලී අනුපාතය බල නොපායි.

* ණය ආපසු ගෙවන කාල සීමාව, සුදුසුකම් ලත් උපරිම ආපසු ගෙවීමේ කාලයට යටත්ව, අදාල බැංකු ශාඛාවට තීරණය කල හැක.01000000000